# බළන්ගොඩ නගර සභාව

## 2023-03-14 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.03.14**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රීනී | එම් ජී ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

**01. පසුගිය සභාවේ 2023-02-14 දිනැති මහා සභා වාර්තාව, 2023-02-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-03-07 දිනැති විශේෂ මහ සභා වර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2023-02-14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-02-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-03-07 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රීනී ජී චන්ද්‍රලතා මැතිතුමිය , 2023-02-14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-02-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-03-07 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙම සභා වාර්තාවන්හි සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2023-02-14 දින පැවති මහ සභාවේ සභා වාර්තාව, 2023-02-23 දිනැති විශේෂ මහ සභා වාර්තාව හා 2023-03-07 දිනැති විශේෂ මහ සභාවේ සභා වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**පෙ.ව 10.02 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 10.02 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා මෙම සභා වාරය විශේෂ මහ සභා වාරයක් බවද තමා සභාපති ධූරය දැරූ වර්ෂයක කාල සීමාව තුළ සභාවේ ආදායම් ඉහළ නැංවීම සඳහා විශාල ලෙස ක්‍රියා කළ බවද 2023 වර්ෂයේ අයවැයේදී ගැබිණි මව්වරුන් සඳහා රුපියල් කෝටියක පමණ මුදලක් සහ මන්ත්‍රීවරුන්ට සංවර්ධන වැඩකටයුතු වෙනුවෙන් විශාල මුදලක්ද වෙන් කරන ලද නමුත් රටෙහි පවත්නා ආර්ථික අර්බුදය හේතුවෙන් රජයෙන් එම සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පිළිබඳ ගැටලුකාරි තත්වයක් වී ඇති බවද මන්ත්‍රීවරුන් ලෙස මෙම සභාවට පැමිණ ජනතාව වෙනුවෙන් යම් සේවාවක් ලබා දීමට සභාවේ මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාහට හැකියාව ලැබූ ඉවට තමන් විශ්වාස කරන බවද පැවසීය.

- අත්‍යවශ්‍ය ගමනක් යෙදී ඇති බැවින් 2023-03-14 දින මහ සභාවට සහභාගී නොවන බවත්,නිවාඩු අනුමත කර දෙන ලෙසත් ,ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**පෙ.ව 10.06 ට පමණ ගරු නාගරි මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**පෙ.ව 10.06 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා සභාවට පැමිණෙන ලදී.**

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- රත්නපුර මහාධිකරණ නඩු අංක WA 15/2020 දරණ නඩුවට අදාළව පෙත්සම්කාර අභියාචකයින් ස්වකීය නීතිඥ නෙවිල් කරුණාරත්න මහතා මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරන අභියාචන පෙත්සම ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
  මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ලිපිය එම නඩුවේ පෙර නඩු තීන්දුවට එරෙහිව අභියාචනා කිරීමට අදාළ දැන්වීම බවත් එතෙක් මෙම කඩ කාමර සභාව වෙත පවරා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කරන බවත් පවසා සිටින ලදී.

- පදික කඩ ලබා දීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් ඉල්ලා සිටීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ලද CLG/LG/5/2/1/2-111 හා 2023.02.28 දිනැති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- සීමාසහිත බොඹුව ශක්ති සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය මගින් බෝඹුව පෙර පාසල් දරුවන් සඳහා මසකට එක් වරක් ආහාර වේලක් ලබා දෙන බවත් ඒ සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් දන්වා ඉදිරිපත් කර තිබූ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
  ගරු සභාපතිතුමා පැවසූයේ මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන් දැනුවත් කර ඇති බවත් මේ සම්බන්ධව සභාවේ අදහස් ප්‍රකාශ කරන ලෙසත්ය.අනතුරුව මේ සඳහා ගරු සභාවේ විරුධත්වයක් නොමැති බව තීරණය විය.

**පෙ.ව 10.25 ට පමණ ගරු උප සභාපති එම්.ටී.එම් රූමි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 බළන්ගොඩ නගර සභාව විසින් භුක්ති විඳිනු ලබන පහත සඳහන් ඉඩම් නගර සභාව වෙත පවරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- නගර සභා කාර්යාලය පුස්තකාලය පෙර පාසල පිහිටි බළන්ගොඩ නගර වසමේ ක.සි. 620077 හි කලාප අංක 04 හි කැබලි අංක 28 දරණ කරච්කැටියවත්ත නමැති ඉඩම
- නාගරික තුරු උයන පිහිටි බළන්ගොඩ නගර වසමේ ක.සි. 620076 හි කලාප අංක 01 හි කැබලි අංක 48 දරණ දෙණිපිටියගේකුඹුර නමැති ඉඩම සහ කැබලි අංක 50 දරණ දොරවෙලවත්ත බද්දෙලාගේවත්ත ගල්කැටියවත්ත නමැති ඉඩම් කොටස්

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 ර/ශ්‍රී බුද්ධ ජයන්ති විද්‍යාලය විදුහල්පති යොමුකර ඇති විද්‍යාලීය ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණය කර ගැනීමේ ඉල්ලීම් ලිපිය සම්බන්ධව ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සභා අනුමැතිය ලබා ගැනීම.

මෙම ලිපියට අනුව ර/ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පිටිය මේ වන විට භාවිතා කිරීමට නුසුදුසු තත්වයකට පත්ව ඇති බවත් පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ක්‍රීඩා කටයුතු කිරීමට නොහැකි වී ඇති බවත් සඳහන් කරමින් මෙම ඉල්ලීම සිදු කර ඇති බැවින් මෙය ඉතා කඩිනමින් සිදු කර දිය යුතු අවශ්‍යතාවයක් බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 අංක 791/09/01, තොසිල ගාර්ඩන්, කිරිඳිගල, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි රවීන්ද්‍රන් සුවේන්ද්‍රන් යන අය 2016-09-06 වන දින බළන්ගොඩ නගර සභාවේ තානායම සම්බන්ධයෙන් ටෙන්ඩර් කැඳවීමේදී තැන්පත් කළ රු 25000/ ඇප තැන්පත් මුදලට අදාළ 2016-09-16 දිනැති 50834 දරණ ලදුපත අස්ථාන ගත වීම හේතුවෙන් එම මුදල නිදහස් කිරීම සම්බන්ධව සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය වෙන්දේසි හා අපහරණ ක්‍රියාවලිය සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 බළන්ගොඩ නගර සභාව සතු බළන්ගොඩ තානායම අළුත්වැඩියා කිරීමට අදාළව පළාත් ඉංජිනේරු සේවා ප්‍රධාන ලේකම් වෙත ඊට අදාළ ඇස්තමේන්තුව කඩිනමින් සකස් කර දෙන ලෙස ඉල්ලීම් කළද එහි ප්‍රමාදය හේතුවෙන් නගර සභාවට මාසිකව රු.300,000.00 ක ආදායමක් අහිමි වීම සහ අළුත්වැඩියා නොකර නව බදුකරුවෙකු තෝරා ගැනීම කළ නොහැකි බැවින් තානායමෙහි ඉදිරි කටයුතු පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජෙ ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු තානායම මේ වන විට බදුකරුගෙන් නැවත සභාව වෙත පවරා ගෙන ඇති බවද එහි වර්තමාන තත්වය අනුව විශාල අලුත්වැඩියාවක් සිදු කළ යුතු බවද සම්පූර්ණම අලුත්වැඩියාවක් සිදු කරන්නේ නම් එයට විශාල මුදලක් වැය වන බවද එසේ සිදු කිරීමට සභාවට මූල්‍යමය හැකියාවක් නොමැති බවද ඊට විශාල කාලයක් වැය වීමේදී සභාවට විශාල ආදායමක් අහිමි වන බවද සාමාන්‍ය තත්වයෙන් අලුත්වැඩියාවක් සිදු කිරීමට රුපියල් ලක්ෂ 50-60 ක් අතර මුදලක් වැය වෙතැයි අපේක්ෂා කල හැකි බවද හැකි ඉක්මනින් මෙය සිදු කර ටෙන්ඩර් කර සභාවට ආදායමක් ලබා ගත යුතු බවද පවසන ලදී.

ගරු නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් මේ වන විට තානායම අලුත්වැඩියාව සිදු කිරීම අත්‍යවශ්‍යම කාරණයක් බවද එසේ නොකළහොත් වැසි ජලය කාන්දුවීම හේතුවෙන් මෙහි ගොඩනැගිල්ල විනාශ වී යා හැකි බවද එබැවින් මෙය කඩිනමින් සිදු කල යුතු බවද පවසන ලදී.

ඒ අනුව තානායම අලුත්වැඩියාව සභාව සතු මූල්‍ය හැකියාව මත රුපියල් ලක්ෂ 50-60ක් අතර මුදලකින් සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 පොදු වෙළඳසැල අංක 05 දරණ කඩ කාමරයේ කඩ කුළිය වැඩි වීම හේතුවෙන් 2023.03.02 දින සිට යළි සභාව වෙත පවරා ගැනීමට කටයුතු සලසා දෙන සුමතිපාල හෙට්ටිආරච්චි යන අය ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධව ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ඉහත යෝජනාවට අදාළ ඉල්ලීම කරන ලද සුමතිපාල හෙට්ටිආරච්චි යන අය විසින් එම ඉල්ලීම ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් ඉහත යෝජනාව ඉවත් කරන බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.**

06:01:07 බළන්ගොඩ නගර සභාවේ ලීටර් 2500 සහ ලීටර් 4000 ගලි බවුසරය (නගර සීමාවෙන් පිටත)ඉන්ධන මිල ගණන් වලට අනුව සංශෝධනය විය යුතු මිල ගණන් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් වර්තමානයේ රටේ ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ගලි බවුසරයේ සේවාව සැපයීමේදී අනුමත කර ඇති මිල ගණන් වරින් වර සංශෝධනයන්ට ලක්වූ බවත් ඒ අනුව අවසාන මිල සංශෝධනයට අනුව නගර සීමාවෙන් පිට වැඩිවෙන සෑම කිලෝමීටරයක්

සඳහාම අයකරන ගාස්තුව මෙතෙක් අදාළ ස්ථානයට යැම සඳහා පමණක් අයකරන ලද අතර,ආපසු ගලි ප්‍රතිකාරක ඒකකය වෙත මළ අපද්‍රව්‍ය රැගෙන ඒමේදී අයකර ගැනීමක් සිදු කර නොමැති බවත් එබැවින් ඉන්ධන මිල වරින් වර වෙනස්වීම මත සභාවට දැරීමට සිදුවී ඇති වියදම අධික වීම සැලකිල්ලට ගෙන මිල ගණන් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය මත ඒ පිළිබඳව තීරණය කිරීම සහ අනුමැතිය සඳහා විෂය නිලධාරී විසින් ගරු සභාව වෙත ඉදිරිපත් කරන බවද පැවසීය.

<u>නගර සීමාවෙන් පිටත ගලි බවුසරයේ සේවා සැපයීමේ මිල සංශෝධනය</u>

| ලීටර් 2500 | | ලීටර් 4000 | |
|---|---|---|---|
| **සංශෝධනයට පෙර මිල** | **සංශෝධිත මිල** | **සංශෝධනයට පෙර මිල** | **සංශෝධිත මිල** |
| රු.350.00 (වැඩිවෙන සෑම කි.මී.01 සඳහා) | රු.450.00 (කි.මී.10ත් 20ත් අතර)up & down එකතුව<br>රු.550.00 (කි.මී.20 ට වැඩි)up & down එකතුව | රු.450.00 ( වැඩිවෙන සෑම කි.මී.01 සඳහා) | රු.600.00 (කි.මී.10ත් 20ත් අතර)up & down එකතුව<br>රු.750.00 (කි.මී.20 ට වැඩි )up & down එකතුව |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 බස්නැවතුම්පොල කඩ හිමියන්ට වෙළදාම අඩු වීම හේතුවෙන් බළන්ගොඩ නගර සභාවට අයත් බස් නැවතුම්පොළ පදිකකඩ සඳහා අයකරන වර්තමාන කඩ කුලිය රු.3000.00 මුදල වැඩි කර අයකරන ලෙස බස්නැවතුම්පොල කඩ හිමියන්ගේ ඉල්ලීම සම්බන්ධව ගත හැකි ක්‍රියාමාර්ග සඳහා සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම කඩකුලී මුදල සභාව විසින් තීරණය කරන ලද්දේ තක්සේරු වාර්තාව ලැබෙන තුරු පමණක් බවත් දැනට නව තක්සේරු වාර්තා ලබා ගැනීමට ඉල්ලීම් යොමු කර ඇති බවත් ඒ අනුව නව තක්සේරු වාර්තාව ලැබුනු පසු මෙම කඩ හිමියන්ගේ ගැටලුව නිරාකරණය වෙනු ඇති බවත්ය.

**ඒ අනුව ඉහත යෝජනාව ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.**

06:01:09 බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා 3/2020 චක්‍ර ලේඛය අනුව වසර 3 කට වරක් සිදු කරන තක්සේරුව බදුකරුවන්ගේ ඉල්ලීම අනුව කඩකාමර වර්ෂ 5කට වරක් තක්සේරු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 බස් නැවතුම්පොළ කඩ කාමර මාස 6 ක් ගිවිසුම් ඇප තැන්පත්කල බදුකරුවන්ගේ ගිවිසුම් ඇප තැන්පත් මාස 3 ක් දක්වා අඩුකර ඉතිරි ගිවිසුම් ඇප කඩකුලී සඳහා හිලව් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම බස් නැවතුම්පොළ කඩ කාමරවල ගිවිසුම් අලුත් කරනුයේ වාර්ෂිකව බවත් එබැවින් ඉහත ආකාරයට මාස 6ක් ගිවිසුම් ඇප තැන්පත් තබා ගනු ලබනුයේ එම කඩ හිමියන් වාර්ෂිකව ගිවිසුම් අත්සන් කිරීමට පෙර කඩ කුලී ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් එම හිඟ මුදල් හිලව් කිරීමට බැවින් මෙම ඉල්ලීම පිළිබඳව නැවත සලකා බැලිය යුතු බව පවසා සිටියේය.ඒ අනුව ගරු සභාවේ ඒකමතික තීරණය වූයේද මෙම ඉල්ලීම අසාධාරණ බවයි.

**එබැවින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව ප්‍රතික්ෂේප විය.**

06:01:11 බස් නැවතුම්පොළ පෙර ගෙවූ මුදල් ක්‍රමය (key money) පදනම් කරගත් නව කඩකුලී තක්සේරුවක් ලබා ගැනීම සඳහා පෙර ගෙවූ මුදල් ක්‍රමය (key money) තැබූ බළන්ගොඩ බස් නැවතුම්පොළ කඩ හිමියන්ගේ ඉල්ලීම පිළිබඳ සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ලේකම්තුමාගෙන් අදාළ කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

අනතුරුව කාරක සභාව තුළදී ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් දැක්වීම් වලට අනුව බස් නැවතුම්පොළ පෙර ගෙවූ මුදල් ක්‍රමය (key money) පදනම් කරගත් කඩ හිමියන්ගේ මෙම ඉල්ලීම සාධාරණ බවත් පළාත් පාලන කොමසාරිස්තුමාට පිටපත් සහිතව දැනට තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉදිරිපත්ව ඇති තක්සේරුව සඳහා සංශෝධන සිදු කර දෙන ලෙස ඉල්ලීම් කිරීම සුදුසු බවත් එම තක්සේරු වාර්තා ලැබෙන තෙක් දැනට අයකරන කඩකුලිය අයකිරීම සුදුසු බවටත් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 බළන්ගොඩ නගර සභාව සතු ZA 9835 ගලි බවුසරය /ZA 5326 මෝටර් ග්‍රේඩරය /HF 7899 ජේ.සී.බී. යන්ත්‍රය /ZA 5039 ජේ.සී.බී. යන්ත්‍රය යන වාහනවල නව තක්සේරුව සඳහා හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂක බී.ජී.අයි.ජී ආරියදාස මහතා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2015 යටතේ ගෙවීම් කිරීම සහා අනුමැතිය ලබා ගැනීම.

<u>වාහන තක්සේරු කිරීම බළන්ගොඩ නගර සභාව 2023 වර්ෂය</u>

| වාහනයේ නම හා අංකය | නව තක්සේරු වටිනාකම |
|---|---|
| ZA 5326 මෝටර් ග්‍රේඩරය | රු. 18,000,000.00 |
| ZA 9835 ගලි බවුසරය | රු. 9,000,000.00 |
| HF 7899 ජේ.සී.බී. යන්ත්‍රය | රු. 2,250,000.00 |
| ZA 5039 ජේ.සී.බී. යන්ත්‍රය | රු. 9,000,000.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 වරිපනම් අංක 175/ඒ, හපුතලේ පාර ,කිරිඳිගල, බළන්ගොඩ දරණ ස්ථානයේ පවත්වාගෙන ගිය ව්‍යාපාරය අංක 167 දරණ නව ස්ථානයකට රැගෙන යාම හේතුවෙන් එම පෙර පැවති ස්ථානය සඳහා නේවාසික වරිපනම් ප්‍රතිශතය අයකරන ලෙස ගොඩනැගිල්ලෙහි හිමිකරු වන එම්.ඒ.ඩී.එන්.යූ.පී අරසකුලරත්න යන අයගේ ඉල්ලීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 බළන්ගොඩ නගර සභාවේ රියදුරු ඊ.එම් අතුල කීර්ති යන අයගේ වැඩිපුර අයවූ කාර්යසාධන ණය වාරිකය වන රු.4342.00 ක මුදල නැවත ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජෙ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 පාසල් ක්‍රීඩා භූමිය සංවර්ධනය කර ගැනීම සඳහා ශාන්ත ඇග්නස් බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය විසින් කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 තිවංක ඉඳුවර නමැති සිසුවාගේ පෙර පාසල් ඇතුළත් වීමේ ගාස්තුව රු.2000.00 ක මුදල එම දරුවාගේ පවුල විදෙස් ගත වීම හේතුවෙන් නැවත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 නාම පුවරුවක් සවි කිරීමට ස්ථානයක් වෙන් කරවා ගැනීමට එම්.ඩබ්.ඒ.එස් ජයමාන්න යන අය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත නම සඳහන් අය සුශිල්පා පෞද්ගලික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි විෂය උපකාරක පන්ති පවත්වන බවත් බස්නැවතුම්පොළෙහි ගුවන් පාලමෙහි පිහිටා ඇති එක් පැති බැම්මක හෝ බළන්ගොඩ බලගහමුල පිහිටි සම්පත් පියස මධ්‍යස්ථානයේ ඉහළ යන ස්ථාන ද්විත්වයෙන් එක් ස්ථානයක ප්‍රචාරක

පුවරුව සවි කිරීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් දන්වන ලදී.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 බළන්ගොඩ ඔරලෝසු කණුව වටරවුම කොටසෙහි ප්‍රචාරක පුවරු සවිකිරීම සඳහා KFC ආයතනය වෙත අවසර ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ස්ථානය පරීක්ෂා කර බලා වැඩ අධිකාරී වාර්තාවක් ලබා ගැනීමෙන් පසු නියමිත ගාස්තු අයකර ප්‍රචාරක පුවරු සවි කිරීමට අවසර ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 යශෝධරා පාසල් භූමිය ආරක්ෂා වන පරිදි පැති බැම්මක් ඉදිකිරීම සඳහා යශෝධරා ළමා නිවාස සංවර්ධන සමිතිය මඟින් කර ඇති ඉල්ලීී සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත නම සඳහන් පාසල් භූමියේ පහල කොටස නායයෑමේ අවදානම් තත්වයක් පවතින බැවින් එම පාසලේ පාලක සභාවට ලැබී ඇති පරිත්‍යාග මුදලින් පැති බැම්මක් ඉදිකිරීමට ඔවුන් තීරණය කර ඇති බවත් ඒ සඳහා නගර සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් එම ලිපිය මඟින් ඉල්ලීම් කර ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව පැති බැම්මට අදාළ සැලසුම සැලසුම් කමිටුව සඳහා යොමුකර අනුමැතිය ලබා ගෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවසර ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 බළන්ගොඩ නව බස් නැවතුම්පොළ සී 21-ඒ දරණ කඩ කාමරයේ කඩ මුහුණත් දොර වෙනස්කිරීම සඳහා කඩ හිමියා වන මොනී කල්දේරා යන අයගේ ඉල්ලීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව වැඩ අධිකාරී වාර්තාවක් ලබා ගැනීමෙන් පසු ඉහත ඉල්ලීම සුදුසු වන්නේ නම් පමණක් ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 ඊ.තිලංග ප්‍රනාන්දු, සී 57, බස් නැවතුම්පොළ දරණ ස්ථානයෙහි ඉදිකිරීම සම්බන්ධව වැඩ අධිකාරී වාර්තාව සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2023.02.14 දිනැති මහ සභාවේ තීරණ අංක 06:01:10 අනුව වැඩ අධිකාරී ස්ථානීය පරීක්ෂාවක් සිදු කර ලබා දෙන වාර්තාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව තීරණය කළ බවත් ඒ අනුව වැඩ අධිකාරී වාර්තාව ඉදිරිපත් කර ඇති බවත් එම වාර්තාවට අනුව

- අදාළ ස්ථානය පරීක්ෂා කළ බවත් නිරීක්ෂණ අනුව 2022.09.13 දිනැති මහ සභාවේ සාකච්ඡා කළ පරිදි කඩ හිමියා විසින් කඩ කාමරය පිටුපස ඇති දැනට සමාජ විරෝධී කටයුතු සඳහා භාවිතා වන කොටස ආවරණය වන පරිදි කඩ කාමරය පිටුපසට දිගු කර ඇති බවත්
- සමාජ විරෝධී කටයුතු කරන්නන් විසින් මෙම කඩ කාමරය හා ගඟ අතර ඇති කොටස අසල ඇති තාබෑරුම වෙත ඒමට භාවිතා කරන අතර අදාල සමාජ විරෝධි ක්‍රියාද එයි සිදු කරන බවද එබැවින් ගරු සභාවේ සාකච්ඡා කල පරිදි එය වැලැක්වීම සඳහා එම කොටසට පිවිසිය නොහැකි පරිදි සවිමත් කම්බි වැටක් ඉදි කිරීමෙන් එය වළක්වා ගත හැකි බවත්
- එම කඩ කාමරය අසල ඇති විදුලි බල මණ්ඩලය සතුව ඇති පුවරු සහිත කාමරයද මෙම සමාජ විරෝධී ක්‍රියා සඳහා භාවිතා වන බැවින් එයද ආවරණය වන පරිදි ඉදිරිපත් කර ඇති සටහන පරිදි බිත්ති කොටසක් ඉදි කිරීමෙන් එය වළක්වා ගත හැකි බවත් වැඩ අධිකාරි විසින් සභාවට දැනුම් දී ඇති බවත් පවසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා වැඩ අධිකාරි ඉදිරිපත් කර ඇති සටහන අනුව මෙම ස්ථානයෙහි ඉදිකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2023-04-09 දින සංගීත ප්‍රසංගයක් පැවැත්වීම සඳහා නගර සභා ක්‍රීඩාපිටිය සහ මහජන පොළ අතර ස්ථානය නිදහස් කර දෙන ලෙස ඉල්ලීම් කරමින් එමිල් ප්‍රියශාන්ත ප්‍රනාන්දු යන අය විසින් යොමු කර ඇති ඉල්ලීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම් රූම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කලේ අප්‍රේල් 09 යන දිනය මහජන පොළ අසල ඉතා කලබලකාරී සහ වාහන තදබදයක් පවතින දිනයක් විය හැකි බැවින් මෙම දිනය සහ ඉල්ලුම් කරන ස්ථානය සම්බන්ධව ගැටළුවක් පවතින බව වේ.

අනතුරුව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ අදහස් විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ගරු නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් කරන ලදී.

පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ගරු උප සභාපති එම්.ටී.එම් රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු මහ සභාව බවට පත් කරන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමා මෙම සංගීත ප්‍රසංගය පැවැත්වීම සම්බන්ධව ගැටළුවක් නොමැති බවත් දිනය සහ ස්ථානය සම්බන්ධව පමණක් ගැටළුවක් පවතින බැවින් සංගීත ප්‍රසංගය පවත්වන දිනය වෙනස්කර ළමා උද්‍යානය සහ ක්‍රීඩා පිටිය අසල ස්ථානය මේ සඳහා ලබා දිය හැකි බවත් යෝජනා කලේය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංගකෝන් මැතිතුමිය**

07:01:01 ඇල්ලෙපොල කාපට් අතුරන ලද මාර්ගයේ වැසි ජල කාණුව අවහිර වී ඇති බැවින් එම කාණුව සුද්ද කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා**

07:02:01 බස්නැවතුම්පොළ ඉදිකර ඇති නව පදික කඩ කාමර සංකීර්ණය සඳහා විදුලිය ලබා දීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංගකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

07:02:02 බළන්ගොඩ කහටපිටිය පාර මුස්තාපා මාවත කඩිනමින් අළුත්වැඩියා කිරීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

07:02:03 එළඹෙන රාමසාන් උත්සවයට පෙර ගොරොක්ගහමඩ, බෙතල්හිල් මාවත, කහටපිටිය මාර්ගය, අලාබ්දීන් මාවත, දෙහිගස්තලාව කොටසක්, පහළ කිරිමැටිතැන්න කොටසක් යන ස්ථානවල විදුලි පහන් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව මන්ත්‍රීනී මංගලිකා ඉලංගකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**07:03 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:03:01 බළන්ගොඩ නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම්, බැනර්, පෝස්ටර් සහ කටවුට් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට පනවා ඇති ගාස්තුව රු.300.00 ක් වන අතර එය වාර්ෂිකව රු 500.00 ක් ලෙස සංශෝධනය කිරීම සඳහා යෝජනා කිරීම.

07:03:02 බළන්ගොඩ නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම්, බැනර්, පෝස්ටර් සහ කටවුට් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට පනවා ඇති රු.300.00 ක් වන ගාස්තුව රු.200.00 ක් ලෙස සංශෝධනය කිරීම සඳහා යෝජනා කිරීම.

07:03:03 එල් ඊ ඩී නාමපුවරු සවිකිරීම සඳහා වර්තමානයේ මාසිකව වර්ග අඩියක් සඳහා අයකරන රු.200.00 ගාස්තුව සංශෝධනය කර වාර්ෂිකව රු.500.00 ක් ලෙස සංශෝධනය කිරීම සඳහා යෝජනා කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.අනතුරුව මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ බළන්ගොඩ නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම්, බැනර්, පෝස්ටර් සහ කටවුට් මාසයක් ප්‍රදර්ශනය කිරීමට ගාස්තුවක් මේ වන විට ගැසට් කර තිබුනද වාර්ෂිකව ප්‍රදර්ශනය කිරීමට ගාස්තුවක් ගැසට් කර නොමැති බැවින් මෙම මාසික ගාස්තු අයකිරීමේ ක්‍රමය මත දැන්වීම් ප්‍රචාරක කරුවන්ට ඉතා විශාල මුදලක් වාර්ෂිකව දැරීමට සිදු වන බැවින් මෙම ගැටලුවට කිසියම් හෝ සාධාරණයක් සභාව මඟින් ලබා දෙන්නේ නම් ඉතා වටිනා බවයි.

අනතුරුව මේ සම්බන්ධව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් ප්‍රකාශ කලේ මෙමඟින් සභාවට වර්ග අඩියකට රු.3100.00 ක මුදලක් මාසිකව අහිමි වන බවත් මෙලෙස ගාස්තු අඩුකිරීම මඟින් සභාවට විශාල පාඩුවක් සිදුවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා අදහස් දක්වමින් ප්‍රකාශ කලේ බළන්ගොඩ නගරයට ඉතා විශාල ආකර්ෂණීයභාවයක් ලබා දෙන LED නාම පුවරු සඳහා ප්‍රචාරක ගාස්තු අඩුකිරීම මඟින් සහනයක් ලබා දීම යහපත් ක්‍රියාවක් බවත් දැනට අයකරන ගාස්තු මඟින් LED නාම පුවරු සඳහා විශාල මුදලක් වාර්ෂිකව දැරීමට සිදුවන බැවින් මෙම පුවරු භාවිතා කරන සේවාලාභීන් වර්තමානය වන විට LED නාම පුවරු ප්‍රචාරක කටයුතු නවතා දමා ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ප්‍රකාශ කලේ ඉහත යෝජනා තමා ඉදිරිපත් කර ඇත්තේ ආදායම් අංශයේ දත්ත මඟින් බවත් එබැවින් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් විෂය නිලධාරි ගෙන්වා තොරතුරු ලබා ගැනීමට තමන් යෝජනා කරන බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ඒ අනුව සිදුකල පැහැදිලි කිරිමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පහත පරිදි ගාස්තු සංශෝධනයන් සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

2023 ගැසට් පත්‍රය අනුව ප්‍රචාරක දැන්වීම් බැනර්,කටවුට්,පෝස්ටර් ප්‍රදර්ශනය කිරීම

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා මාසයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 32 ක් සඳහා මාසයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 32 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|---|
| බැනර්,කටවුට්,පෝස්ටර් | රු.300.00 | රු.9,600.00 | රු.115,200.00 |

වර්ග අඩියක් සඳහා වර්ෂයක් වෙනුවෙන් අයකරන මුදල සම්බන්ධව ගැටලුවක් පවතින බැවින් එය රු.1000.00 ක් ලෙස ගාස්තු සංශෝධනය කිරීම.ඒ අනුව,

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 32 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|
| බැනර්,කටවුට්,පෝස්ටර් | රු.1,000.00 | රු.32,000.00 |

2023 ගැසට් පත්‍රය අනුව LED ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම.

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා මාසයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 200 ක් සඳහා මාසයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 200 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|---|
| LED ප්‍රචාරක දැන්වීම් | රු.200.00 | රු.40,000.00 | රු.480,000.00 |

- වර්ග අඩියක් සඳහා වර්ෂයක් වෙනුවෙන් අයකරන මුදල වැඩි අගයක් බැවින් LED ප්‍රචාරක දැන්වීම් වර්ග අඩි 200 ක් හෝ ඊට වැඩි නම් වර්ෂයකට වර්ග අඩියක් වෙනුවෙන් රු.750.00 ක් ලෙසත්,
- LED ප්‍රචාරක දැන්වීම් වර්ග අඩි 200 අඩුනම් වර්ෂයකට වර්ග අඩියක් වෙනුවෙන් රු.700.00 ක් ලෙසත් ගාස්තු සංශෝධනය කිරීම.ඒ අනුව

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 200 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|
| LED ප්‍රචාරක දැන්වීම් (වර්ග අඩි 200 ට වැඩි) | රු.750.00 | රු.150,000.00 |
| LED ප්‍රචාරක දැන්වීම් (වර්ග අඩි 200 ට අඩු) | රු.700.00 | රු.................(අදාළ වර්ග අඩි ගණන අනුව) |

**2023 ගැසට් පත්‍රය අනුව ස්ථිර දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම**

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 32 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 500 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|---|
| ස්ථිර දැන්වීම් පුවරු(පෞද්ගලික) | රු.300.00 | රු.9,600.00 | රු.150,000.00 |

මෙම ගාස්තු වර්ග අඩි 200ට වඩා අඩු ස්ථිර දැනවීම් පුවරුවක් නම් වර්ග අඩියක් සඳහා වර්ෂයක් වෙනුවෙන් රු.300.00 ක මුදලක්ද, වර්ග අඩි 200ට වැඩි ස්ථිර දැන්වීම් පුවරුවක් නම් වර්ග අඩියක් සඳහා වර්ෂයක් වෙනුවෙන් රු.200.00 ක් ලෙස ගාස්තු සංශෝධනය කිරීම.

ඒ අනුව ,

| දැන්වීම් වර්ගය | වර්ග අඩි 1 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 200 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව | වර්ග අඩි 500 ක් සඳහා වර්ෂයක් වෙනුවෙන් ගාස්තුව |
|---|---|---|---|
| ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩි 200 ට අඩු (පෞද්ගලික) | රු.300.00 | රු.60,000.00 | - |
| ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩි 200 ට වැඩි (පෞද්ගලික) | රු.200.00 | - | රු.100,000.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රීනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය**

07:04:01 බුද්ධ ජයන්ති මාර්ගයේ ඉහළ කොටසේ මාර්ගය සහ පස් සිරවී ඇති කාණු පද්ධතිය සුද්ද කිරීම.
ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2023-03-07 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

02.2023 පෙබරවාරි මස කර්මාන්ත අංශය මඟින් සිදුකළ කර්මාන්තවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම.

03. මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීම

- ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා (යෝජනා අංක 03:01:01 සිට 03:01:02 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රීනි ජී .චන්ද්‍රලතා මැතිතුමිය ( යෝජනා අංක 03:02:01 සිට 03:02:04 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ( යෝජනා අංක 03:03:01 සිට 03:03:04 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා ( යෝජනා අංක 03:04:01 සහ යෝජනා අංක 03:08:01)
- ගරු නාගරික මන්ත්‍රීනී අයි.ඒ.එම් ඉලංගකෝන් මැතිතුමිය ( යෝජනා අංක 03:05:01 )
- ගරු නාගරික මන්තත්‍රී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය ( යෝජනා අංක 03:06:01 සිට 03:06:02 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ( යෝජනා අංක 03:07:01 සිට 03:07:06 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ( යෝජනා අංක 03:09:01 )

04. ලිපි මඟින් ලැබෙන යෝජනා

- 01 අංක 45,කල්තොට පාර,බළන්ගොඩ,නාලන්දාව උසස් අධ්‍යාපන ආයතනය විදුලි පහනක් ලබා ගැනීම සම්බන්ධ ලිපිය
- 02 අංක 45, කරවිකැටිය පාර, බළන්ගොඩ දරණ ස්ථානයෙහි ඒ.ජී විමලදාස මයා විසින් යොමු කර ඇති කැඩී ඇති ප්‍රධාන කාණුව පිළිසකර කිරීම.

ඉහත සඳහන් කර්මාන්ත වෙනුවෙන් යන්ත්‍ර, සේවකයන් හා රථවාහන ලබාගැනීම සඳහාත්, 2022 මාර්තු මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු කටයුතු ඉටුකිරීම සඳහාත් නිර්දේශය ලබා දීම.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

2023-02-01 සිට 2023-02-28 දක්වා ආදායම් හා වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 10,095,553.00 |
| වෙනත් ලැබීම් | 2,760,871.79 |
| මුලු ලැබීම් | 12,856,424.79 |
| පුනරාවර්තන වියදම් | 9,119,845.61 |
| වෙනත් වියදම් | 4,935,833.03 |
| මුලු වියදම් | 14,055,678.64 |

2023-02-01 සිට 2023-02-28 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| RD-8000 | 48,600.00 |
| 56-1906 | 36,450.00 |
| 227-5020 | 100,035.00 |
| RD - 8240 | 83,025.00 |
| VI1833 | 4,000.00 |
| 226-7521 | 48,600.00 |
| BC-0005 | 53,250.00 |
| GC 0001 | 8,910.00 |
| LL - 7688 | 36,450.00 |
| JD-4684 | 6,480.00 |
| ND-5124 | 62,775.00 |
| PF-4006 | 122,715.00 |
| QL-2901 | 18,000.00 |
| RC-1107 | 72,900.00 |
| RE - 2600 | 81,000.00 |
| UQ1933 | 6,480.00 |
| HF -7899 | 94,150.00 |
| HF -8558 | 20,250.00 |
| FP - 0002 | 160,000.00 |
| RB 4786 | 64,800.00 |
| එකතුව | 1,128,870.00 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**පෙ.ව 11.21 ට පමණ ගරු සභාපතිතුමා මූලාසනයේ කටයුතු ගරු උප සභාපතිතුමා වෙත භාරදී අත්‍යවශ්‍ය කටයුත්තක් හේතුවෙන් සභාවෙන් පිටවන වන බව දන්වන ලදී.**

**පෙ.ව 11.22 ට පමණ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**පෙ.ව 11.22 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**පෙ.ව 11.23 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**පෙ.ව 11.23 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම.**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**12.අවසානය**

මෙදින පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් නොමැති බැවින් මෙදින සභාවේ කටයුතු පවත්වා ගෙන යාමට සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී මණ්ඩලය සහ බළන්ගොඩ නගර සභාවේ සියළු කාර්යමණ්ඩලයට ස්තුතිය පුද කරන ප්‍රකාශ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.25 ට පමණ අවසන් කරන ලදී.

**ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.